# බෞද්ධ දර්ශනයේ අන්තර්ගත පාරිසරික ආචාරධර්ම මගින් පරිසර හිතකාමී ජනසමාජයක් ගොඩනැගීම

එෆ්. එන්. ජෝසප්[1]

පරිසරයේම එක් සුවිශේෂී හා තීරණාත්මක ප්‍රපංචයක් වන මිනිසා ආදි යුගයේ තම වාස භූමියේ පැවති දේශගුණය, භූ විසමතාව, ජලවහනය, පස හා වෘක්ෂලතාවරණය යනාදී සාධක අනුව තම දෛනික දිවිපෙත සකසා ගනු ලැබිණි. ඒ අනුව ලොව එක් එක් ප්‍රදේශයන්හි එකිනෙකට වෙනස්වූ ප්‍රාථමික සංස්කෘතීන් බිහිවූ අතර එවැනි සංස්කෘතීන් ලොව පහළ වූ විවිධ ආගමික ශාස්තෘවරුන්ගේ හා ආගමික නායකයන්ගේ මඟ පෙන්වීමෙන් දියුණු ජනසමාජයන් බවට පත්විය. විද්‍යාව හා තාක්ෂණයේ සොයාගැනීම් සමග එකී සංස්කෘතීන් සමාජ, ආර්ථික හා පාරිසරික වශයෙන් විශාල ලෙස විපරිණාමය වී ඇත.

මෙම විපරිණාමයත් සමග පාරිසරික වශයෙන් ලොව පුරාවිවිධ ගැටලු රාශියක් පැනනැගී තිබේ. විශේෂයෙන්ම සංවර්ධනය කරා පියනැගීමේ දී සිදු කළ පාරිසරික පිරිවැය ඇසුරින් ඇතිවූ ජල දූෂණය, වායු දූෂණය, ජෛව හායනය හා දේශගුණ වෙනස්වීම් වැනි ගැටලුවලට විසඳුම් ලෙස පෙර අපර දෙදිගම නව සංකල්පයන් බිහිකරගෙන ඇත. නිදසුන් වශයෙන් 'තිරසර සංවර්ධනය, හරිත ආර්ථිකය' වැනි සංකල්ප පෙන්වාදිය හැකිය. නමුත් මිනිසාට වඩාත් සමීප ආගමික පරිසරය ඇසුරින් පරිසර හිතකාමී සමාජයක් ගොඩනැංවීම උදෙසා යොමුකර ඇති අවධානය ප්‍රමාණවත් එකක් නොවේ. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණවන්නේ බෞද්ධ දර්ශනයේ අන්තර්ගත පාරිසරික ආචාරධර්ම හා එකී ආචාර ධර්ම ඇසුරින් පරිසර හිතකාමී ජනසමාජයක් ඇතිකරලීමේ විභවතාව විමර්ශනය යි.

ශ්‍රී ලාංකික ජනයාගෙන් 70.19% ක ප්‍රමාණයක් බෞද්ධාගමිකයින් වන අතර බහුතරය බෞද්ධාගමිකයන් වීම කරණ කොටගෙන ආගමික පරිසරය ඇසුරින් ජනයා තුළ පරිසර හිතකාමී ආකල්ප වර්ධනය අනෙක් සංකල්ප තුළින් පරිසර හිතකාමී ආකල්ප වර්ධනයට වඩා පහසු එකක් වෙයි. මිනිසාගේ ත් ලෝකයේ ත් පැවැත්ම පිළිබඳ පිළිවෙළින් මුල, මැද හා අග යනාදී වශයෙන් අර්ථවත් හේතු-ඵල දහමකින් යුක්ත බෞද්ධ දර්ශනයේ අන්තර්ගත පාරිසරික ආචාරධර්ම වලින් ජනයා සුපෝෂිත කිරීම වැදගත් වේ.

මෙහි දී බෞද්ධ දර්ශනයේ අන්තර්ගත වඩාත් ප්‍රායෝගික මට්ටමේ පවතින පාරිසරික ආචාර ධර්ම විමර්ශනය බෞද්ධ සූත්‍ර ධර්ම ඇසුරින් සිදුකළ අතර එවැනි ආචාර ධර්ම පිළිබඳ පවතින අවබෝධය විමර්ශනය සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරනු ලැබීය. එහිදී නියැදිය ලෙස කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධාගමික විද්‍යාර්ථීන් 50 ක් තෝරා ගනු ලැබිණි. ඒ අනුව බෞද්ධ දර්ශනයේ ඇතුළත් පාරිසරික ආචාර ධර්ම පිළිබඳ පවතින්නේ අඩු අවබෝධයක් බවත් මෙම ආචාර ධර්ම ඇසුරින් පරිසර හිතකාමී සමාජයක් ගොඩනැංවීම සඳහා තරුණ පිරිස කැමැත්තක් දක්වන බවත් පෙනී ගියේය. මෙම පාරිසරික ආචාරධර්ම මගින් පරිසර හිතකාමී ජනසමාජයක් ගොඩනැගීම සඳහා වැඩි අවකාශයක් පවතින බවත් එහිදී ආගමික සංහිඳියාවෙන් යුක්තව සාමකාමී ලෙස ආගම් වාදය ඉස්මතු නොවන අයුරින් කටයුතු කිරීම අවශ්‍ය වන බවත් අනාවරණය වුණි.

**ප්‍රමුඛ පදඃ** බෞද්ධ දර්ශනය, පාරිසරික ආචාර ධර්ම, පරිසර හිතකාමී ජනසමාජය

1 සහකාර කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයනඅංශය, කැලණිය විශ්වවිද්‍යාලය
Email: fra.nadee@gmail.com